දකුණු පළාත් සභාව
தென் மாகாண சபை
SOUTHERN PROVINCIAL COUNCIL
අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா நுறை அமைச்சு
Ministry of Education, Land & Land Development, Highways & Information
බිම් මහල, "දකුණ පාය" , ලබුදුව, ගාල්ල. கீழ் மாடி,"தக்ஷின பாய",லபுதுவ,காலி. Ground Floor, "Dakshina Paya" , Labuduwa, Galle.

මගේ අංකය. / எனது இல. / My No. SP/EDUMIN/EDU/24/21(i)

ඔබේ අංකය. / உனது இல. / Your No.

දිනය. / திகதி. / Date. 2026.11.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගාල්ල, උඩුගම, ඇල්පිටිය, අම්බලන්ගොඩ,
මාතර, අකුරැස්ස, දෙනියාය, මුලටියන,
හම්බන්තොට, තංගල්ල, වලස්මුල්ල.

දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026

දකුණු පළාත් සභා පාසල්වල සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු සඳහා මා විසින් නිකුත් කරන ලද 2026.08.25 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛ 02/2026 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ 2026 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව සකස් කරන ලද මාරු මණ්ඩල තීරණ අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියට (edumin.sp.gov.lk) යොමු කර ඇති අතර, එම ස්ථාන මාරුවීම් 2026.11.30 දින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

03. තවද මෙම ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳව අදාළ නිලධාරීන්ට කල් ඇතිව දැනුම් දී නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකර රඳවාගත නොහැකි අතර, නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවටද අදාල නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. මෙම ස්ථාන මාරුවීම් නියෝග සම්බන්ධයෙන් කිසියම් නිලධාරියකු අභියාචනා ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් මේ සමඟ අමුණා ඇති අභියාචනා අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර 2026.11.16 දිනට පෙර විදුහල්පති ශ්‍රේණිධාරීන් විසින් **සෘජුවම මා වෙත** ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරන අභියාචනා සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලය විසින් සලකා බැලීමට කටයුතු නොකරන බව අවධාරණය කරමි.

05. මෙම ස්ථාන මාරු තීරණ ඔබ කලාපයට අයත් සියලු නිලධාරීන් දුටු බවට තහවුරු කර ගැනීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

එන්.කේ.ආර්.පතිරණ,
ලේකම්.

පිටපත - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.ගැ.ස හා අ.ක.ස

ලේකම් / செயலாளர் / Secretary 091-2246156 091-2030701
කාර්යාලය / காரியாலயம் / Office 091-2030700 පාලන / நிர்வாகம் / Administration 091-2030705 අධ්‍යාපන / கல்வி / Education
091-2030703 සැලසුම් / திட்டமிடல் / Planning 091-2030702 ගිණුම් / கணக்காய்வு / Accounts
ෆැක්ස් / பெக்ஸ் / Fax 091-2246157 091-2234044
ඊමේල් / மின்னஞ்சல் / E-mail : secretary@edu.min.spgov.lk
ක්ෂණික ඇමතුම් / அதிரடி அழைப்பு / Hot Line : 091-2030700
වෙබ් අඩවිය / இணையத்தளம் / web site : www.edumin.sp.gov.lk